# Path to Success – Study Pack

තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# නාට්‍ය හා රංගකලාව

# 10 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
කේ.ඩී.එම්.එස්. කළුආරච්චි - ගුරු සේවය

**සියලු හිමිකම් ඇවිරිණි**

# රංග භූමිය

- **නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයක් රංග භූමියක් ලෙස හැඳින්වේ.**

- රංග පීඨය, කරළිය, රඟ මඬල, වේදිකාව යන නොයෙකුත් නම් වලින් රංග භූමිය හඳුන්වයි.


- රංග භූමියේ ආරම්භය මානව සංහතියේ ආරම්භයත් සමගම සිදු වූවකි. ආදි වාසී ජනතාව අතර තිබූ දඩයම් සංස්කෘතියේ එක් අංගයක් වන්නේ මස් පුළුස්සා කෑමයි. ගිනි මැලයක් ගසා දඩයම් කරන ලද සතුන් එහි පිලිස්සෙන්නට හැර එතෙක් එම ගිනි මැලය වටා රොක් වී නටමින් ප්‍රීති වෙති. අනෙක් සාමාජිකයන් මෙය නරඹා ආස්වාදයක් ලබයි. මෙම "**ගිනි මැල භූමිය**" මානවයාගේ පළමු රංග භූමිය වේ.




- අතීතයේ ශාන්තිකර්ම රඟ දැක් වූ "**යාග භූමිය**" මෙන්ම කොළ පෑගීමට ගන්නා කමත ද පෙර රංග භූමි ලෙස භාවිතයට ගෙන ඇත.

- සොකරි ගැමි නාටකය සඳහා "**කමත**" රංග භූමිය කොට ගෙන ඇත.

- කෝළම් රංග භූමිය සඳහා ද එළිමහන් භූමියක් යොදා ගන්නා අතර එය "**තානායම්පොළ**" නමින් හඳුන්වයි.




- ඉන්පසු නාඩගම් නාට්‍ය සඳහා යොදා ගත්තේ "**කරළිය**" නම් වූ රඟබිමයි.



- එතැන් සිට වර්තමාන වේදිකාව වන "**පින්තූර රාමු වේදිකාව හෙවත් ප්‍රොසීනියම් වේදිකාව**" ලංකාවේ ජනප්‍රිය වන්නට විය.

## රංග භූමිය ප්‍රධාන අංග තුනකි

1. රංග භූමිය
2. ප්‍රේක්ෂාගාරය
3. නේපත්‍යාගාරය

## රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ

1. රංග භූමිය සමතලා බිමක් විය යුතුය.
2. නළු නිලියන්ට රඟපෑමට ප්‍රමානවත් අවකාශයක් තිබිය යුතුය.
3. ප්‍රේක්ෂකයන්ට පහසුවෙන් නැරඹිය හැකි වන සේ පිහිටා තිබිය යුතුය.
4. රංග ශිල්පීන්ට අවශ්‍ය වන අවම පහසුකම් වලින්වත් රංග භූමිය සමන්විත විය යුතුය.

## රංග භූමි වර්ග

- රංග භූමි ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ.
    1. එළිමහන් රංග භූමි
    2. ගෘහස්ථ රංග භූමි


- වර්තමානයේ නාට්‍යකරුවන් භාවිතයට ගන්නා රංග භූමි මෙසේ වර්ග කළ හැකිය.
    1. එරීනා රංග ශාලා (කවාකාර, වට රවුම්)
    2. අර්ධ කවාකාර රංග භූමි
    3. ප්‍රොසීනියම් වේදිකා (පින්තූර රාමු, ආරුක්කු)
    4. ජංගම වේදිකා

**<u>ප්‍රොසීනියම් වේදිකාව (පින්තූර රාමු, ආරුක්කු)</u>**



නූතන රංග භූමිය හෙවත් ප්‍රොසීනියම් වේදිකාව කොටස් 9 කට බෙදනු ලැබේ. සෘජුකෝණාශ්‍රාකාර හැඩයකින් යුක්ත මෙම රංග භූමියේ බෙදීම **"භූගෝලීය බෙදීම"** නමින් හඳුන්වයි. මෙහි පිටුපස **"ගඝනිකාව නොහොත් සයික්ලොරාමාව"** නැමැති සුදු පැහැති තිරය ඇත. මෙම බෙදීම **"පළමුව වැදගත් වන්නේ නාට්‍ය**

**පෙළ රචකයාටය.”** ඔහුට නාට්‍ය පෙළෙහි රංග විධාන මගින් වේදිකාවේ නිශ්චිත ස්ථාන නම් කරයි. දෙවනුව වැදගත් වන්නේ අධ්‍යක්ෂකවරයාට හා නළු නිලියන්ටය. වේදිකාවේ නළු නිලියන් හැසිරවීම මෙමගින් පහසු වේ. තුන් වනුව වැදගත් වන්නේ අනුශාංගික ශිල්පීන්ටයි. අවසාන වශයෙන් රංග භූමි පාලකට වැදගත් වේ.




**<u>ක්‍රියාකාරකම</u>**

- **වර්තමාන යේ පවතින දේශීය රංග ශාලාවන් හි පින්තූර අලවන්න**
- **“දේශීය රංග ශාලාවෙහි විකාශය” යන මැයෙන් රචනයක් ලියන්න**
- **වේදිකාවේ භූගෝලීය බෙදීම ඇඳ නම් කරන්න**
- **රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ මොනවාද?**

## රංග අභ්‍යාස

- නළුවකු හෝ නිළියක විසින් යම් රංග කුසලතාවක් වර්ධනය කරගනු පිණිස කායික හා මානසික සංවර්ධනය සඳහා සිදු කරන අභ්‍යාස රංග අභ්‍යාස වේ.

- රංග අභ්‍යාස රැසකි.

1. ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස
2. ශිථිලකරණ අභ්‍යාස
3. ශ්වසන අභ්‍යාස
4. සංවේදන අභ්‍යාස
5. කටහඬ අභ්‍යාස
6. චිත්ත ඒකාග්‍රතාව ඇති කිරීමේ අභ්‍යාස

## රංග අභ්‍යාස මගින් ඇති ප්‍රයෝජන

1. සබකෝලය නැති කර ගැනීමට
2. රංගන හැකියාව දියුණු කර ගැනීමට
3. සාමූහිකව කටයුතු කිරීමට
4. පුද්ගල පෞරුෂය දියුණු වීමට
5. ගායන, නර්තන කුශලතාවයන් වර්ධනයට
6. සිසුන් අතර අන්තර් සම්බන්ධතා පැවැත්වීමට
7. ආධුනික ගති ලක්ෂණ නැති කර ගැනීමට
8. දක්ෂ රූපණ ශිල්පියෙකු වීමට





## රංග ක්‍රීඩා

නළු නිළියන්ගේ ක්‍රියාකාරී බව වර්ධනය කර ගැනීම සඳහා කරන ක්‍රීඩා රංග ක්‍රීඩා වේ.







## රංග ක්‍රීඩා වලින් ලැබෙන ප්‍රයෝජන

1. මානසික ආතතියට හුරු වීම
2. ජය පරාජය විඳ ගැනීමේ හැකියාව
3. ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව
4. සාමූහිකත්වය වර්ධනයට
5. හොඳින් අවධානය පවත්වා ගැනීමට
6. අවංක බව
7. විනෝදාස්වාදයක් ලැබීමට

<u>**ක්‍රියාකාරකම**</u>

1. **රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස හඳුන්වන්න**
2. **ඔබ දන්නා රංග ක්‍රීඩා ලියන්න**
3. **නළුවාට රංග අභ්‍යාස වල යෙදීමෙන් ඇති වැදගත්කම පිළිබඳ විස්තරයක් කරන්න**

## නාට්‍ය පෙළක් ලියමු

නාට්‍ය පෙළ යනු නාට්‍ය පිටපතයි. නාට්‍යයක් සාර්ථක මෙන්ම ගුණාත්මක වීමට නාට්‍ය පිටපත ගුණාත්මක විය යුතු ය. එසේ නම් නාට්‍ය පෙළක් නිර්මානයේදී මූලික අවශ්‍යතා මොනවාදැයි බලමු.

- **නාට්‍යෝචිත බව**

ඉතිහාස කතාවක්, ජන කතාවක් හෝ ජීවිත අත්දැකීමක් ආදී කුමන හෝ සිද්ධියක් නාට්‍යයක් සඳහා තෝරා ගැනිමේදී එම කතාවෙහි ඇති නාට්‍යමය ගුණය ඇති අවස්ථා මොනවාදැයි විමසිය යුතු ය. කතාවෙහි අනවශ්‍ය කොටස් බැහැර කොට සුදුසු අවස්ථා පමණක් පමණක් තෝරා ගනී.

- **රංග විධාන**

නාට්‍ය පෙළෙහි සංවාද වලට අමතරව රංග විධාන ඇතුළත් වේ. රංග විධාන යනු පිටපතෙහි සඳහන් නළු නිලියන්ට හා අධ්‍යක්ෂකට වේදිකා හැසිරීම් පිළිබඳවත් රංගාවබෝධය පිණිසත් යොදා ඇති කෙටි සටහන් ය. එනම් වේදිකාවට අවතීර්ණ වීම් හා පිටවීමේ රටා හැඟීම් ප්‍රකාශන ආදිය ඉන් කිහිපයකි.

- **ගැටුම**

නාට්‍යයේ කුතුහලය රඳා පවතින්නේ ගැටුම මතය. ගැටුම අභ්‍යන්තර හා බාහිර වශයෙන් කොටස් දෙකකි. පුද්ගලයෙකු තවත් පුද්ගලයෙක් හා ගැටීම මෙන්ම මානසික ඝට්ටනය ද නාට්‍යයක බලවත් වේ. නාට්‍යයක් සාර්ථක හෝ අසාර්ථක වන්නේ එම නාට්‍යයෙහි ඇතුළත් ගැටුම් අවස්ථා මත වේ. ප්‍රේක්ෂකයා දර්ශනයෙන් දර්ශනයට බැඳ තබන්නේ නාට්‍ය තුල ඇති ගැටුම් අවස්ථා ය.

- **සංවාද**

කතාවක් නාට්‍ය පිටපතකින් වෙනස් වන්නේ සංවාද මගිනි. ප්‍රබල සංවාද ගුණාත්මක නාට්‍ය පිටපතක් බිහි කරයි. කතාව ඉදිරියට ගෙන යන්නේ සංවාද ය. නාට්‍යයේ දී යොදා ගන්නා සංවාද හරවත් මෙන්ම

ප්‍රේක්ෂක මනසට පහසුවෙන් ආමන්ත්‍රනය කළ හැකි විය යුතුය. සංවාද භාවිතයේදී මනා සැලසුමකින් යුක්ත විය යුතු ය. එමෙන්ම වචනාර්ථයට වඩා පැහැදිලි වන ගැඹුරු අර්ථයකින් ද යුක්ත විය යුතුය.

- **කතා වින්‍යාසය**

නාට්‍යයක් සඳහා පෙළ රචනයේ දී මුල මැද අග සහිතව කතාව ඉදිරිපත් විය යුතු ය. මෙය කතා වින්‍යාසයයි. කතානදරයක මෙන් ක්‍රමවත් ගලා යෑමක් අවශ්‍ය නොවූවත් නාට්‍යයක සිද්ධි අතර හොඳ අන්තර් සම්බන්ධතාවයක් තිබිය යුතු ය.

- **ශෛලිය**

නාට්‍යය රචනයේ දී මුලින්ම තෝරා ගනු ලබන්නේ නාට්‍ය ශෛලියයි. නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී වශයෙන් කොටස් දෙකකට ඇති නාට්‍ය ශෛලියෙන් ප්‍රේක්ෂකයා වඩාත් ප්‍රිය කරනුයේ ලෝකධර්මී ශෛලියටය. එයට හේතුව ලෝකධර්මී ශෛලිය ප්‍රේක්ෂකයාට වඩාත් පහසුවෙන් අවබෝධ කර ගත හැකි වීමයි.

**<u>ක්‍රියාකාරකම</u>**

1. **නාට්‍ය පෙළක් රචනා කළ හැකි නාට්‍යෝචිත සිද්ධි හෝ කතා එකතු කරන්න**
2. **ඉන් එක් සිද්ධියක් ඇසුරින් නාට්‍ය පෙළක් රචනා කරන්න**
3. **නාට්‍යයක ගැටුම නාට්‍යයට වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න**
4. **කත්දරයක හා නාට්‍යයක වෙනස වගු ගත කරන්න**

## නාට්‍යයක් රඟ දක්වමු

මෙහිදී  අපි නාට්‍ය පෙළ තෝරා ගැනීමේ සිට නාට්‍ය රඟ දැක්වීම දක්වා පියවර වශයෙන් සාකච්ඡා කරමු.

- **නාට්‍ය පෙළ තෝරා ගැනීම**

  මෙහිදී බොහෝ විට අපේ රටෙහි අධ්‍යක්ෂක හා පිටපත් රචකයා තනි පුද්ගලයෙකි. නමුත් එසේ නොමැති අවස්ථා වලදී අධ්‍යක්ෂකවරයා විසින් නාට්‍ය පෙළක් තෝරා ගනු ලබන්නේ පිටපත් රචකයෙකුගෙනි. සුදුසු නාට්‍ය පෙළක් තෝරා ගනු ලැබීමෙන් පසු නාට්‍ය අධ්‍යක්ෂකගේ කාර්යය ආරම්භ වේ.

- **නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම**

  මෙහිදී නාට්‍ය පිටපත් රචනයෙහි අයිතිය වෙනත් අයෙකු සතු වුවහොත් අවශ්‍ය නම් අධ්‍යක්ෂකවරයාගේ මනෝභාවයන්ට අනුකූලව පෙළ රචකයා සමඟ සාකච්ඡා කොට පිටපතෙහි යම් යම් වෙනස්කම් කර ගනු ලැබේ. නාට්‍ය පිළිබඳව ඔහු මනසේ මවා ගන්නා සිතිවිල්ල හෙවත් දළ සැලැස්ම ඔස්සේ අවශ්‍ය නළු නිළි සංඛ්‍යාව, අනුශාංගික ශිල්පීන්, වේදිකා සැලැස්ම පුහුණුවීම් ආදිය සැලසුම් කරයි.

- **නළුවරණය**

  අධ්‍යක්ෂකගේ මනෝභාවයට අනුකූලව අවශ්‍ය නළු නිළි සංඛ්‍යාව තෝරා ගනු ලැබේ. සුදුසු නළු නිලියන් තෝරා ගැනීමෙන් අනතුරුව ඔවුන්ට හිමි නාට්‍ය පෙළ, නාට්‍ය පිළිබඳ සාරාංශය, චරිත

පිළිබඳ විස්තර, පුහුණුවීම් කාලසටහන, නීති රීති ආදී උපදෙස් සපයනු ලැබේ. නළුවාට කියවීමට දෙනු ලබන දෙබස් හා නිරූපන මගින් උචිත නළුවන් තබා ගැනීමටත් නුසුදුසු නළුවන් ඉවත් කිරීමටත් අධ්‍යක්ෂකට මෙයින් හැකියාව ලැබෙන අතර වෙනත් ප්‍රවීණයෙකුගේ උපදෙස් ලබා ගැනීම ද වටී.

- **පෙළ කියැවීම හා පූර්ව සැලසුම**

  නළුවරනයෙන් පසුව ශිල්පීන් සමඟ පෙළ කියැවීම ආරම්භ කරයි. අධ්‍යක්ෂකවරයා තම මනසේ මවා ගත් සිතුවම පෙළ කියැවීම අතරතුර වරෙන් වර විස්තර කර දෙයි. චරිතයන් පිළිබඳ ගැඹුරු අවබෝධය ,නළුවන්ගේ පරිකල්පන හැකියාව, දෙබස් මතක තබා ගැනීමේ පහසුව ලැබෙන තුරු නාට්‍ය පෙළ පිළිබඳ සාකච්ඡාවේ යෙදේ. අදහස් විමසයි. වේදිකාවේ පසුතල ස්ථානගත කිරීම්, නළුවන් ස්ථානගත කිරීම් මෙන්ම පිටපතෙහි විවිධ සලකුණු තබා ගැනීම් ආදී කටයුතු ද අධ්‍යක්ෂක විසින් මෙහිදී සිදු කරයි. මෙය නිෂ්පාදන පිටපත වේ.

  මේ සඳහා ඉඩකඩ ඇති ස්ථානයක් යොදා ගනී. නාට්‍ය පුහුණුවීම් සඳහා යම් කාල සීමාවක් ගත වේ. නාට්‍ය පිටපත අතින් අතහැර රංගනය නිශ්චිත වන තුරු අධ්‍යක්ෂක විසින් නළුවන් හසුරවයි. මුලින්ම මෙසේ සමස්ථ නාට්‍ය පුහුණුවීම් වල යෙදවූවත් පසුව ජවනිකා වශයෙන් පුහුණු කරයි. එය අඩුපාඩු සකසා ගැනීමට ඉමහත් වාසිදායක වේ. මෙසේ වෙන් වෙන් ව පුහුණු කල කොටස් සියල්ලම තනි නිෂ්පාදනයක් ලෙස පුහුණු කෙරෙන්නේ ඊට පසුවය. එහි දී ගත වන කාලය නාට්‍යයෙහි රිද්මය චරිත යන සියල්ලම අධ්‍යක්ෂක විසින් අවධානයට ලක් කරයි. අවසාන පුහුණුවීම් කාලය තුල අනුශාංගික ශිල්පීන් ගේ දායකත්වයන්ගේ ගැලපීම ද වරෙන් වර ගෙන්වා නාට්‍ය පුහුණුවීම් හා සම්බන්ධ කර ගනී. මෙහිදී එක් එක් ශිල්පියාට වෙන වෙන ම කාලය වෙන් කෙරෙන අතර මෙය කාර්මික පුහුණුව ලෙස හඳුන්වයි.




- **සාවේශ පුහුණුව**

  නාට්‍යයට අදාල ඇඳුම් සමඟ සම්පූර්ණ පුහුණුවීමක් මෙහිදී අපේක්ෂා කෙරේ.

- **මංගල දර්ශනය**

  නාට්‍ය නිෂ්පාදනයේ දොරට වැඩුම මෙය වේ ආරාධිත අමුත්තන්ගේ ද සහභාගිත්වයෙන් මෙය පැවැත්වේ. මෙහි දී යම් අඩුපාඩුවක් පිළිබඳ පැහැදිලි විවේචනයක් ඇති වුව හොත් මහජන දර්ශනයට පෙර එය සකස් කර ගැනීමේ හැකියාව අධ්‍යක්ෂක සතු වේ.

- **රැඟුම් පාලක මණ්ඩලයේ අවසරය ලබා ගැනීම**

  නාට්‍යයක් මහජන දර්ශනයට පෙර සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයෙන් අවසර ගත යුතු ය. මහජන දර්ශනයක් සඳහා නීතියෙන් වලංගු වන්නේ මෙම අවසරයෙන් පසුවය.

**<u>ක්‍රියාකාරකම</u>**

1. **"නාට්‍යයක් යනු සාමූහික ක්‍රියාවලියකි" පැහැදිලි කරන්න**
2. **නාට්‍ය නිෂ්පාදනයක පියවර කෙටියෙන් සටහන් කරන්න**
3. **මෙවැනි කාර්යයකදී අධ්‍යක්ෂක වරයාට පැමිණිය හැකි ගැටළු මොනවාද?**

## රංග උපකරණ නිර්මාණය කරමු

රංගනයේදී නළුවන් භාවිත කරන භාණ්ඩ රංග භාණ්ඩ ලෙස හඳුන්වයි. නාට්‍යයක් වේදිකා ගත වීමේ දී නළුවන් තම රංග කාර්යය පහසු කර ගැනීම සඳහා මෙවැනි රංගෝපකරණ භාවිත කරයි. රංගෝපකරණ භාවිතය සෑම නාට්‍යයකම දක්නට නොමැත. නාට්‍යයේ ශෛලිය අනුව මෙන්ම නාට්‍යකරුවාගේ අභිමතය පරිදි රංග උපකරණ භාවිතය වෙනස් වේ.


**රංග භාණ්ඩ නිර්මාණයේ දී සැළකිලිමත් විය යුතු කරුණු**

- නාට්‍යයේ අදාළ කාළයට දේශයට යුගයට නිර්මාණය කරන උපකරණ ගැලපිය යුතු ය
- පහසුවෙන් පරිහරණය කළ හැකි මෙන්ම සරල හා සැහැල්ලු විය යුතු ය
- අඩු වියදම් සහිත නිමාවකින් යුක්ත විය යුතු ය
- මෙම භාණ්ඩ සාමාන්‍ය පරිහරණය කෙරෙන භාණ්ඩ වලට වඩා ප්‍රමාණයෙන් විශාල වන අතර සාමාන්‍ය පරිහරණ භාණ්ඩ සෑදීමට යොදා ගන්නා අමු ද්‍රව්‍ය යොදා නොගනී ( උදාහරණ - නාට්‍යයකට කඩුවක් නිර්මාණය කිරීමේ දී ලී හා ප්ලාස්ටික් බට යොදා ගැනීම)
- රූපනයේදී නළුවා අතදරා සිටින උපකරණ මෙන්ම වේදිකාව මත තබා ඇති උපකරණද නළුවාගේ රංගනයට මෙන්ම නාට්‍යයේ අනෙකුත් අනුශාංගික කලා සමග ද මනා සේ ගැළපිය යුතුය
- නිර්මාණශීලී විය යුතු ය
- කල් පැවතිය යුතුය

**විශේෂ බඳුනක් නිර්මාණය කිරීම**

**අවශ්‍ය ද්‍රව්‍ය**

- බයින්ඩින් කම්බි
- කෝඩ්නූල්
- කඩදාසි(පත්තර කොළ)
- බයින්ඩර් ගම්
- සිහින් ලී කුඩු හෝ වැලි



**සාදන ක්‍රමය**

- ඉහත දැක්වූ ප්ලාස්ටික් භාජන දෙක නිසි හැඩය ලැබෙන පරිදි තබා කඩදාසි වලින් අලවා ගන්න
- ඉහත කොකු හැඩය කම්බි වලින් නවා කොළ අලවා සකසා ගෙන කඩදාසි ආධාරයෙන් භාජනය දෙපස තබා නිසි පරිදි සම්බන්ධ කරන්න. පසුව එයට කුඩා කඩදාසි කැබලි අලවා අවශ්‍ය නිමාව ලැබෙන පරිදි සකස් කරගන්න.
- අවශ්‍ය පරිදි කෝඩ් නූල් ඇලවීම ආධාරයෙන් රටා සැරසිලි යොදන්න.
- වියළුණු පසු භාජනයේ සම්පූර්ණ මතුපිට තලය පුරා ගම් ආලේප කර සිහින් ලී කුඩු හෝ වැලි පෙනේරයක් මගින් භාජනය මතට හලන්න. හොඳින් වියලුනු පසු වර්ණ ආලේප කරන්න.

**<u>ක්‍රියාකාරකම</u>**

1. **ඉහත රංගෝපකරණ නිර්මාණය කරන්න**
2. **සරල රංග උපකරණයක් නිර්මාණය කරන ආකාරය ලියන්න**
3. **නාට්‍ය ශෛලිය අනුව රංග උපකරණ වෙනස් වන්නේ කෙසේද?**
4. **රංග උපකරණ නිර්මාණය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය 10 ක් නම් කරන්න**

## නිර්දිශ්ට නාට්‍යයට නව අර්ථ කථනයක්

දික්තල කාලගෝල නාට්‍යය වෙනත් අර්ථයක් ඇතිව එසේත් නොමැති නම් නව තේමාවකින් යුතුව නිෂ්පාදන හැකියාව මෙමගින් අරමුණු කරයි. නමුත් මෙය එකවරම කළ හැකි යැයි සිතෙන පහසු කටයුත්තක් නොවේ. ඉතා ජනප්‍රිය වූ මෙවැනි නාට්‍යයක කතා වස්තුව, ශෛලිය, නාට්‍යමය උපක්‍රම මෙන් ම විශේෂයෙන් මෙම කතාවෙහි ඇති **ප්‍රබලතා හා දුබලතා** පළමුව හඳුනා ගත යුතු ය.

**ප්‍රබලතා**

- සරල කතාන්දරයක් නාට්‍යෝචිත අවස්ථා සහිතව ඉදිරිපත් කිරීම
- ඒ ඒ අවස්ථා ඉස්මතු කිරීමට යොදා ගත් ගීත හා සරල තනු
- රංග ප්‍රවේශන හා නිශ්ක්‍රමණ විධි
- රංග භූමිය භාවිතය (ගඟ තරණය කිරීම වැනි)
- කතාව ගලා ගෙන යැමේදී තෙවන පාර්ශ්වයක මැදිහත් වීමෙන් සත්‍යය හෙළිදරව් වීම
- කාලගෝල තමාගේ ස්වරූපය, තරාතිරම අවබෝධ වීමෙන් නිවැරදි තීරණයකට එළැඹීම

**දුබලතා**

- මෙම කතා වස්තුවෙහි ගෙයි වැඩට කුලිය වශයෙන් මිල ගෙවනු ලබන්නේ දියණිය පාවා දීමෙනි
- කාලීන සිදුවීමක් ලෙස තෝරා බේරා ගැනීමට ඇති අපහසුව

**සිසුන් මේ සඳහා නව අර්ථකථනයක් දීමේදී වඩාත් ප්‍රබල නාට්‍යෝචිත අවස්ථාවක් තෝරා ගැනීමට මතක තබා ගත යුතු ය.**

**උදාහරණ ලෙස නව අර්ථකථන කිහිපයක්**

- දික්පිටියා ද දික්තලාගේ ස්වරූපය අවබෝධ කොට ගෙන ඇයව අතහැර යාම
- කතාව අවසානයේ කාලගෝල විසින් දික්තලාව දික්පිටියා ට භාර කළත් දික්තලා කාලගෝල සමගම යෑමට කැමති වීම
- දික්පිටියා ද විවාහක පුද්ගලයෙක් බව පසුව හෙළි වීම

**<u>ක්‍රියාකාරකම</u>**

1. **මෙවැනි කාලීනව නව අර්ථකථන දිය හැකි වෙනත් ජන කතා, ජාතක කතා එකතු කරන්න**
2. **කාලගෝල නාට්‍යය සඳහා නව තේමාවක් ලබා දී නැවත කතාව ගොඩ නැගීමට උත්සාහ කරන්න**
3. **ඒ සඳහා ඔබ යොදා ගන්නා ශෛලිය කුමක්ද?**
4. **එහි කතා තේමාව කුමක්ද?**
5. **නිර්දිෂ්ට නාට්‍යයෙහි ඔබ හඳුනා ගත් ප්‍රබලතා හා දුබලතා මොනවාද?**

## ප්‍රකාශනාත්මක නිරූපණ

යම් සංගීත ඛණ්ඩයකට අනුව ඒ සඳහා යම් අදහසක් ප්‍රකාශ වන පරිදි අර්ථාන්විතව හා නිර්මාණශීලීව කෙරෙන නාට්‍යමය චලන සමූහයකි. මෙය අභිරූපනයක් නොවේ. සියුම් වූ භාවාත්මක රිද්මයානුකූල ප්‍රකාශනයකි. මෙහිදී වාචික අභිනය ප්‍රයෝජනයට නොගන්නා අතර ආංගික අභිනය හා සාත්වික අභිනය ප්‍රධාන කොට ගනී. ආහාර්ය අභිනයේ යම් යම් කොටස් නිර්මාණශීලීව යොදා ගනී.

**ප්‍රකාශනාත්මක නිරූපණ ඉදිරිපත් කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු**

- සංගීත ඛණ්ඩයේ ස්වභාවය හා රිද්මයට අනුව චලන භාවිතය
- අර්ථවත් ව අපූර්වත්වයෙන් යුක්ත විය යුතුය
- ආංගික හා සාත්වික අභිනයන් ප්‍රධාන වන අතර ආහාර්ය අභිනයේ යම් මේ කොටස් නිර්මාණාත්මකව යොදා ගත යුතුය
- අවකාශයේ සමබරතාවය රැකෙන පරිදි රංග භූමියේ අවකාශය නිර්මාණශීලීව යොදා ගත යුතු ය
- තේමාවකට උචිත වූ ප්‍රාසාංගික ඉදිරිපත් කිරීමක් විය යුතු ය

**ප්‍රකාශනාත්මක නිරූපණ ඉදිරිපත් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන**

- රිද්මය හා නාදය පිළිබඳ අවබෝධය
- අභිනය මගින් අර්ථය ප්‍රකාශ කිරිමේ හැකියාව
- අවකාශ භාවිතය
- නිර්මාණශීලී බව
- පරිකල්පන හැකියාව

**ක්‍රියාකාරකම**

- විවිධ සංගීත ඛණ්ඩ ශ්‍රවණය කොට ඒවාට අනුව ප්‍රකාශනාත්මක චලන ගොඩ නගන්න
- ඔබ විසින් ශ්‍රවනය කල සංගීත ඛණ්ඩ මොනවාදැයි සටහන් කර ගන්න

## ඉතිහාස කතා ඇසුරින් නාට්‍ය නිෂ්පාදනය

ශ්‍රී ලංකාව හා සම්බන්ධ ඉතිහාස කතා ඇතුළත් ග්‍රන්ථ ලෙස මහා වංශය, දීපවංශය, චූලවංශය, රාජරත්නාකාරය හැඳින්වේ. එම කතාවන් ආගමික කතා රජ කතා, යෝධයන් හා සම්බන්ධ කතා, වීර කතා ආදී වශයෙන් වර්ග කළ හැකි අතර ඒවායින් නාට්‍යයමය ගුණයන්ගෙන් අනූන වූ කතා පුවත් ද දැකගත හැකි වේ.


වර්තමානය වන විට මෙම ඉතිහාස කතා පදනම් කර ගෙන බිහි වූ නාට්‍යයන් බොහොමයක් දැකගත හැකි අතර ඒවාට නව අර්ථ කතනයන් දී නිර්මාණය කර ඇති නාට්‍යයන් ද දැක ගත හැකි වේ.

**උදාහරණ**

- කුවේණි
- සුබ සහ යස
- ගෝටයිම්බර
- සිරි සඟ බෝ
- ඇහැලේපොළ කතාව
- අන්දරේලා
- පණ්ඩුකාභය
- ස්වර්ණමාලි







ඉන් කිහිපයකි. මෑත කාලය වන විට ඉතිහාස කතාවන් සඳහා බොහෝ නැඹුරුවක් ප්‍රේක්ෂකයින් තුළ දැක ගත හැකි අතර වර්තමානයේ බිහි වූ චිත්‍රපට බොහොමයක් ඉතිහාස කතා පදනම් කර ගැනීම ද විශේෂත්වයකි.

**ඉතිහාස කතා මගින් නාට්‍ය නිර්මාණය කිරීමෙන් ඇති ප්‍රයෝජන**

- පුරාතන සිදුවීම් පිළිබඳ අවබෝධය ලබා ගත හැකි වීම
- ඉතිහාස කතා මගින් ලබා ගත හැකි ආදර්ශ හා අත්දැකීම් මගින් වර්තමාන සමාජ ශෝධනය
- පැරණි සංස්කෘතිකාංග අගය කිරීම
- නාට්‍යයක් ප්‍රති නිර්මාණය කිරීමේ පහසුව
- පුරාණ සිදුවීම් චරිත නැවත නැවත හඳුනා ගැනීම
- අපූර්වත්වයෙන් යුතු නාට්‍යයමය අවස්ථා ගොඩනැගීමේ හැකියාව ලැබීම

**ඉතිහාස කතා කිහිපයක්**

- ටිකිරි කුමරු රජ වූ කතාව
- ගෝඨයිම්බර කතාව
- කුසුමාසන දේවිය හෙවත් දෝන කතිරිනා කතාව
- විහාරමහාදේවියගේ කතාව
- පරංගියා කෝට්ටේ ගිය කතාව
- යසලාලකතිස්ස රජුගේ කතාව
- පණ්ඩුකාභය කතාව

**ක්‍රියාකාරකම**

1. **ඔබ දන්නා ඉතිහාස කතා 10 ක් එකතු කර කුඩා පොතක් සාදන්න**
2. **ඉන් එක් කතාවක් තෝරාගෙන නාට්‍ය පෙළක් සකස් කරන්න**
3. **ඔබ සකස් කළ නාට්‍ය පෙළ සඳහා යොදා ගන්නා අනුශාංගික කලාවන්ගේ කටු සටහන් එකතුවක් සාදන්න**
4. **එම නාට්‍ය පිටපතෙහි නාට්‍යෝචිත අවස්ථා මොනවාද?**

## දික්තල කාලගෝල නාට්‍යය

**දික්තල කාලගෝල නාට්‍යය රස විඳිමු**

දික්තල කාලගෝල නාට්‍යය නාඩගම් අනුසාරයෙන් නිර්මාණය වූවක් වන අතර ප්‍රසිද්ධ නාඩගම් රචකයෙකු වූ චාල්ස් සිල්වා ගුරුන්නාන්සේගේ පුතෙකු වූ පුන්‍යසේන ගුණසිංහ විසින් මෙය රචනා කරන ලදී. පන්සිය පනස් ජාතක පොතේ එන උම්මග්ග ජාතකය පදනම් කොට ගෙන මෙම නාට්‍ය නිර්මානය වී තිබේ.

නාට්‍යධර්මී ශෛලයෙන් රචනා වී ඇති මෙම නාට්‍යය පුරාවටම ගීත සින්දු මෙන්ම ගායනා විලාසයෙන් කියනු ලබන ගද්‍ය කොටස් දක්නට ඇත. නර්තනය ද බහුලව දක්නට ඇති අතර පසුතල නිර්මාණය

කරන්නේ වචන මගිනි. අත්වැල් ගායක පිරිස මගින් ගායනය කෙරෙන අතර සරල අභිනයන් සහිතව කතාව ඉදිරිපත් කරයි. මෙම නාඩගම් ශෛලියෙන් ඉදිරිපත් කෙරෙන නාට්‍යවල අත්‍යවශ්‍ය අංගය සේ සැලකෙන්නේ ගීත යි. තිල්ලානා, පසන්, තංගපාඨ වැනි රාග තාල වලින් තනු නිර්මානය වී ඇති අතර ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වූයේ දෙමළ බෙරය හෙවත් මද්දලයයි. ගීත ගැමි ජන ගායනා වලට නැඹුරු බවක් පෙන්වන අතර නාට්‍යයෙහි භාෂාව ද දේශීය ගැමි සංස්කෘතියෙන් පෝෂණය වී ඇත.

ඔවුන් දෙපලගේ නොගැලපීම වේදිකාවට අවතීර්ණ වන මොහොතේම ප්‍රේක්ෂකයාට වැටහෙන අතර **"ආලේ බැන්ද මාගේ රම්‍යවන්/ ඇන්නෑවේ මේ මල කෝළම්"** වැනි ගීත ඊට සාක්ෂි දරයි. ඉතා දීර්ඝ ජාතක කතාවක් වුවද සිත්ගන්නා සුළු ආකාරයකට පහත දැක්වෙන පරිදි නාට්‍ය පිටපතකට ගොනු කර ඇත.

- පොතේ ගුරු විසින් ගයන පූර්ණ විරුදුව
- තෝඩායම් නාට්‍ය රඟ දැක්වීම සඳහා සභාවෙන් අවසර ගැනීම
- බහුබූත කෝළම
- පොතේ ගුරු විසින් දික්තල හා කාලගෝල සබයට කැඳවීම
- ඒ ඒ චරිත තමන් සභාවට හඳුන්වා දීම
- දික්තල සමඟ කාලගෝල ගමට යාම සඳහා මගට බැසීම

  ගඟක් හමු වීම දික්පිටියා හමු වීම එහි දී ඇති වන අරගලය චත්තුදත්ත විසින් තිදෙනා මහෞෂධ පඬි වෙත කැඳවාගෙන යාම නඩුව විසඳීම දික්තල කාලගෝල විසින් දික්පිටියාට භාර දීම
- මංගලම් සිංදුව

මෙසේ ගොඩ නැගෙන නාටකය තුල ප්‍රබල සිත් ගත් නාට්‍යමය අවස්ථා දක්නට ඇත.

- ගඟක සලකුණක් නොමැතිව දික්පිටියා හා කාලගෝල ගඟ තරණය කිරීම
- දික්පිටියා හා කාලගෝල අතර ඇති වන හාස්‍ය උපදවන ගැටුම
- මහෞෂධ පඬි විසින් ගැටලුව විසඳීම
- නැවත දික්තලා දික්පිටියාටම බාර දීම

නාට්‍යය සඳහා සතර අභිනය යොදාගෙන ඇති ආකාරයද ඉතා ආකර්ශනීය වේ. ප්‍රේක්ෂක මනසේ රස ජනනය සඳහා වාචික අභිනය ඉතා සාර්ථක ව යොදා ගෙන ඇති බව පහත අවස්ථා වලින් පෙනී යයි.

- **ආලේ බැන්ද මාගේ රම්‍යවන්.......** ගීතය මෙන්ම **පුන්සඳ පායා දිලෙන වැනි** ......ගීත මගින් කාලගෝලයාගේ සිතෙහි ඇතිවන සතුට මොනවට කියාපාන අතර මොවුන් දෙදෙන අතර ඇතිවන මෙම සංවාදය මගින් දික්තල හා කාලගෝලයා අතර ඇති විරසකය හා දික්තලාගේ ප්‍රතික්ෂේප කිරීම පැහැදිලි වේ.
- දික්පිටියා හා දික්තලා ගඟින් එතෙර වන ආකාරය දකින කාලගෝල **හිටපල්ලා හිටපල්ලා නොගොසින්** ......ගීතය හා ඉන් පසුව ඇති වන වචන හරඹය කදිම අවස්ථාවකි
- මහෞෂධ පඬි ඉදිරියේ නඩුව ඉදිරිපත් කරන ආකාරය

ආංගික අභිනය උද්දීපනය වන අවස්ථා කීපයක් ලෙස දික්පිටියා හා කාලගෝල අතර සටන, දික්පිටියා බිලී බාන ආකාරය, ගඟ තරණය කරන ආකාරය දැක්විය හැක. මෙහි සාත්වික අභිනය යොදාගෙන ඇති

ආකාරය දෙස බලන විට දික්පිටියා හා දික්තලා ගේ මුහුණු වල අනුරාගයත්,කාලගෝලගේ මුහුණේ ඇතිවූ කෝපයත්, දික්තලා කාලගෝල ප්‍රතික්ෂේප කරන විට මුහුණේ ඇති වන පිළිකුලත් ඊට නිදසුන් කිහිපයකි.


නාට්‍යයක ගැටුම යනු නාට්‍යය කෙරෙහි ප්‍රේක්ෂකයා බැඳ තබා ගන්නා ප්‍රබල සාධකයකි. මෙම කාලගෝල නාට්‍යය තුළ ද ගැටුම් අවස්ථා කිහිපයක් දක්නට ලැබේ.

- ❖ කාලගෝල හා දික්තලා එකිනෙකා ප්‍රතික්ෂේප කිරීම නිසා ඇති වන මානසික ගැටුම
- ❖ දික්පිටියා හා කාලගෝල අතර ඇති වන ගැටුම
- ❖ නඩු විභාගය අතර ඇති වන මත ගැටුම
- ❖ කාලගෝල අවසානයේ යථාර්තය අවබෝධ කර ගැනීම නිසා ඇතිවන මානසික ගැටුම

නාට්‍යයෙහි දෘෂ්ටිය වශයෙන් දැක්වෙන්නේ නොගැළපෙන පුද්ගලයන් අතර ඇති වන විවාහයේ අසාර්ථකත්වය යි. ජාතක කතාවේ සඳහන් නොකෙරෙන ජීවිතාවබෝධයක් දික්තල කාලගෝල කතාවෙන් කීමට නාට්‍යකරු සමත් වී ඇත. අවසානයේ ප්‍රබල සමාජ උපහාසයක් ද කෙරේ.

| | |
|---|---|
| • කාලගෝල නාට්‍යය අධ්‍යක්ෂකවරයා | - පුණ්‍යසේන ගුණසිංහ මහතා |
| • කාලගෝල නාට්‍යය සංගීතය | - පුණ්‍යසේන ගුණසිංහ මහතා |
| • කාලගෝල නාට්‍යය රචකයා | - චාල්ස් සිල්වා ගුරුන්නාන්සේ |
| • මෙම නාට්‍ය මුල් වරට රංග ගත වූයේ | - 1975 |
| • මෙම කතා පුවත සඳහා පාදක වූ මූලාශ්‍රය | - උම්මග්ග ජාතකයේ එන කාලගෝල ප්‍රශ්නය |
| • නාට්‍යයේ ශෛලිය | - නාට්‍යධර්මී ශෛලිය |
| • නාට්‍යයේ සම්ප්‍රදාය | - නාඩගම් සම්ප්‍රදාය |
| • කාලගෝල දික්තලාව ලබා ගැනීම පිණිස කළ උපාය | - සත් අවුරුද්දක් බැල මෙහෙවරකම් කිරීම |
| • නාට්‍යයේ තේමාව | - නොගැළපෙන විවාහයක් කර ගැනීම නිසා ඇති වන විපාක පෙන්වා දීම |
| • වැඩි කාලයක් දික්තලාගේ චරිතය රඟ පෑ නිළිය | - මැණිකේ අත්තනායක |



- උම්මග්ග ජාතකය හා දික්තල කාලගෝල නාටකය අතර ඇති වෙනස්කම් -

| **උම්මග්ග ජාතකයේ එන කාලගෝල ප්‍රශ්නය** | **දික්තල කාලගෝල නාට්‍යය** |
|---|---|
| දික්පිටියා දුප්පත් තරුණයෙකි. ගං ඉවුරේ එහා මෙහා ඇවිදිමින් සිටී. | ප්‍රබල චරිතයකි. ගං ඉවුරේ බිලී බාමින් හිඳී. |
| ගඟෙන් පළමුවෙන් ඉදිරිපත් කරන්නේ කවුරුන්දැයි ඇසූ විට කාලගෝලයා එකහෙලාම දික්තලාව යැයි කියයි. | ගඟෙන් එතෙර කිරීම පිළිබඳව තීරණ ගැනීම නිර්මාණාත්මකය. කාලගෝල දික්තලා තනිවම එතෙර කිරීම පිළිබඳ දෙවරක් සිතයි. |
| මහෞෂධ පඬිතුමන්ගේ ශාලාව අසලින් ගමන් කිරීමේදී කාලගෝල හා දික්පිටියා දබර කරන ශබ්දය ඇසී දෙදෙනාම කැඳවා නඩු අසයි. | චත්තුදත්ත නම් අලුත් චරිතයක් මගින් ඔවුන් මහෞෂධ පඬිවරයා අසලට කැඳවාගෙන එයි. |
| නඩුව අසන විට පළමුව දික්පිටියාගෙනුත් දෙවනුව කාලගෝලයාගෙනුත් තෙවනුව දික්තලාගෙනුත් ප්‍රශ්න කරයි. | නාට්‍යයේදී පළමුව කාලගෝලයාගෙනුත් දෙවනුව දික්පිටියාගෙනුත් තෙවනුව දික්තලාගෙනුත් ප්‍රශ්න කරයි. |
| අවසානයේ දික්තලා කාලගෝලයාටම අයිති බව පවසයි. | අවසාන තීන්දුව මගින් දික්තලාට දික්පිටියා හා එකතු වීමට අවසර ලැබේ. |

- දික්තල කාලගෝල නාට්‍යයේ නාට්‍යධර්මී ලක්ෂණ

1. පොතේගුරෙකු සිටීම
2. අත්වැල් ගායක කණ්ඩාමක් සිටීම
3. ස්ථාන ඇඟවීම සඳහා සංකේත භාවිතය
4. ගමන් තාල යොදා ගැනීම
5. ගීත යොදා ගැනීම
6. සංවාද තාලානුකූල වීම

- දික්තල කාලගෝල නාට්‍යයේ නාඩගම් ලක්ෂණ

1. පොතේගුරෙකු සිටීම
2. අත්වැල් ගායක කණ්ඩාමක් සිටීම
3. පූර්ව රංගයක් තිබීම
4. බහුබූත කෝලමාගේ චරිතය යොදා ගැනීම
5. ගීත යොදා ගැනීම

- දික්තලාගේ චරිතයෙන් හෙළි වන යහපත් චරිත ලක්ෂණයක්

කාලගෝලයා දමා යාම සාධරණදැයි දෙවරක් සිතීම

- මෙම නාට්‍යයෙහි ප්‍රධාන චරිතය

කාලගෝල

- සෙසු චරිත

    දික්තලා, දික්පිටියා, මහෞෂධ,

    චන්තුදත්ත

- නාට්‍යයේ ගැටුම් අවස්ථා

    1. දික්තල හා කාලගෝල අතර ගැටුම. මෙය ප්‍රධාන ගැටුමයි. මෙයට හේතුව ඔවුන් අතර පවතින නොගැලපීමයි.

    2. කාලගෝල හා දික්පිටියා අතර ගැටුම

    3.නඩු විභාගය නිසා ඇති වන මත ගැටුම



**ක්‍රියාකාරකම**

1. **දික්තල කාලගෝල නාට්‍ය පිටපත කියවන්න**
2. **ජාතක කතාවේ හා නාට්‍යයේ එන කතාවෙහි අතර ඇති වෙනස්කම් පිළිබඳ විස්තරයක් ලියන්න**
3. **නාට්‍යයෙන් හෙළිවන කාලගෝල චරිත ස්වභාවය පිළිබඳ කෙටි සටහනක් ලියන්න**
4. **මෙම නාට්‍යයේ ඇතුළත් ජනප්‍රිය ගීත ගායනය කරන්න**
    - **ආලේ බැන්ද මාගේ රම්‍යවන්......**
    - **ඇන්නෑවේ මේ මල කෝළම්......**
    - **පුන්සඳ පායා දිලෙන වැනි........**
5. **මෙම නාට්‍යයේ ඇතුළත් නාඩගම් ලක්ෂණ නාට්‍යධර්මී ලක්ෂණ ගැටුම් අවස්ථා ඇතුළත් වගුවක් සකස් කරන්න**